# වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා උපකරණ ලබා ගැනීමට ආධාර ලබාදීම - 2026

## හැඳින්වීම

ග්‍රාමීය මට්ටමේ දී වැඩිහිටියන්ගේ සුබසාධනය, ආදායම් උත්පාදන වැඩසටහන් හා අධ්‍යාත්මික වැඩසටහන් පැවැත්වීමට මෙන්ම සාමූහික ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන් සඳහා මෙම දිවා මධ්‍යස්ථාන, ප්‍රදේශයේ වැඩිහිටි පිරිසට ඉතා ප්‍රයෝජනවත් වේ. දිවා මධ්‍යස්ථානයක වැඩිහිටියන් රැස්වී වැඩසටහන් සංවිධානය කරන බැවින් ඒ සඳහා අවශ්‍යය භාණ්ඩ හා උපකරණ ලබාදීම වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සංකල්පයේ සාර්ථකත්වයට ඉවහල් වේ.

## අරමුණ

සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි මෙම වර්ෂය තුළ එක් දිවා මධ්‍යස්ථානයකට රුපියල් 500,000.00 ක උපරිමයකට යටත්ව දිවයින පුරා පිහිටි දිවා මධ්‍යස්ථාන 25 ක් සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දීමට ක්‍රියාකාරි සැලැස්මෙන් අනුමත වී ඇත "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ගෞරවනිය ජීවිතයක් සුරක්ෂිත රටක් ගොඩනැංවීමට පරපුරක් තැනූ පරපුරක් වන වැඩිහිටියන් වෙනුවෙන් යහපත් සමාජ තත්ත්වයක් ඇති කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් ගම තුළ තවදුරටත් සක්‍රීය වැඩිහිටි දිවියකට මේ නිසා අවකාශ සලසා දීම මෙම වැඩසටහනේ අරමුණයි.

## තෝරා ගැනීමේ නිර්ණායක

1. සක්‍රීය වැඩිහිටි සමිතියකට සම්බන්ධ දිවා මධ්‍යස්ථානයක් විය යුතුය.
2. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් ඉදිකරන ලද හෝ දැනට නිරවුල් ඉඩමක පවත්වාගෙන යනු ලබන වැඩිහිටි දිවා මධ්‍යස්ථානයක් විය යුතුය.
3. උපකරණවල ආරක්ෂාව තහවුරු කර ගැනීමට වැඩපිළිවෙලක් හා විධිමත් නඩත්තු වැඩපිළිවෙලක් සකස්කර තිබියි යුතුය.
4. දිවා මධ්‍යස්ථානය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව සකසන ලද දෛනික හා මාසික සැලස්මක් තිබිය යුතුයි. (Day Activity Plan, Monthly Activity Plan, Annual Plan)

## ක්‍රියාත්මක ක්‍රමවේදය

1. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ලියාපදිංචි වැඩිහිටි සංවිධානයක් විය යුතුය.
2. වර්තමාන ක්‍රියාකාරීත්වය පිළිබඳ විෂය භාර ක්ෂේත්‍ර නිලධාරී වාර්තාව ලබාදිය යුතුය.
3. දෛනික හා මාසික ක්‍රිකාරකම් සැලස්ම හා මෙම වර්ෂය සඳහා අනුමත කරන ලද යෝජිත වැඩ සැලැස්ම අමුණා එවිය යුතුය.
4. ප්‍රාදේශිය ලේකම් ගේ අනු අත්සන සහිත ඉල්ලුම් කරනු ලබන භාණ්ඩ විස්තරය සහිත ඇස්තමේන්තුව අමුණා එවිය යුතුය
5. උපකරණ වෙනත් පාර්ශවයකට හෝ පුද්ගලයෙකුට නොපවරන බවට ලිපිය හා භාණ්ඩ භාරකාරීත්වය හා ආරක්ෂාව සම්බන්ධ භාරකරුගේ එකඟතාවය ප්‍රකාශිත ලිපිය තිබිය යුතුය.
6. උපකරණවල ආරක්ෂාව හා නඩත්තුව තහවුරු කර ගැනීමට ගෙන ඇති වැඩපිළිවෙල අමුණා එවිය යුතුය.
7. ඇමුණුම - 01 යටතේ වන පිරික්සුම් ලැයිස්තුව ඉදිරිපත් කළ යුතුයි.
8. සියලුම ලේඛන හා වාර්තා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය සහිතව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලබා දිය යුතුය.

**ප්‍රගතිය ලබාදීම**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් නිකුත් කරන ලද අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කල යුතු අතර. ඒ, ඒ කාර්යයන් නිමකල වහාම ඡායාරූප සහිත ප්‍රගතිය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.

1. මුදල් ලද බවට ලදුපත (පොදු 172)
2. මිලදී ගත් භාණ්ඩ පිළිබඳ ප්‍රාදේශීය ලේකම් ගේ අනුමැතිය සහිත බිල්පත් සමග වියදම් වාර්තාව
3. උපකරණ හා භාණ්ඩ දිවා මධ්‍යස්ථානවලට ලබාදුන් බවට හා එම භාණ්ඩ භාරගත් බව සනාථ කරන ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

**ඉල්ලුම් කළ හැකි භාණ්ඩ වර්ග**

1. විදුලි උපකරණ
2. ගෘහ භණ්ඩ
3. මුළු තැන්ගේ උපකරණ
4. පුස්තකාල පොත්
5. ගෙවතු වගා උපකරණ
6. ප්‍රථමාධාර උපකරණ (රුධිර පීඩන මීටරය වැනි)
7. ක්‍රීඩා උපකරණ (කැරම් බෝඩ්, දාම් බෝඩ් වැනි)
8. සංගීත භාණ්ඩ
9. ස්වයං රැකියා නිෂ්පාදන සඳහා අවශ්‍ය උපකරණ හා භාණ්ඩ
10. වෙනත් - වැඩිහිටි දිවා මධ්‍යස්ථානයකට සුදුසු උපකරණ

**පසුවිපරම්**

1. සියලුම භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කළ යුතු අතර, එම භාණ්ඩ අදාළ දිවා මධ්‍යස්ථාන පරිශ්‍රයේ ආරක්ෂිතව ස්ථාන ගත කර තැබිය යුතුයි.
2. මෙම භාණ්ඩ ඉන්වෙන්ට්‍රියට අනුව නිසි පරිදි පවතීද යන්න පිළබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත වැඩිහිටි විෂයභාර ක්ෂේත්‍ර නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත වැඩිහිටි විෂයභාර ක්ෂේත්‍ර නිලධාරී මගින් මාස 06 කට වරක් (වාර්ෂිකව දෙවරක්) පසු විපරම් කටයුතු සිදුකර, එම වාර්තාව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට එවිය යුතුයි.
3. අදාළ ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීමට සුදුසු උපදෙස් හා පුහුණුව වැඩිහිටි සමිතියට හා දිවා මධ්‍යස්ථාන සාමාජිකයන්ට ලබාදිය යුතුය.
4. ලබා දෙන භාණ්ඩ හා උපකරණ හානි සිදුවූ අවස්ථාවල, නඩත්තු හා නැවත සැකසීම වැය වන වියදම් වැඩිහිටි දිවා මධ්‍යස්ථානය අයිති වැඩිහිටි සමිතිය/ බලමණ්ඩලය විසින් දැරිය යුතුය.
5. සමාජ විගණන කමිටුව මගින් වාර්ෂික විගණනයක් සිදු කර වාර්තාව එවිය යුතුය.